මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk

| | | |
|---|---|---|
| අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. **CEA/06/EPU/FPR/37/2021** | ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. | දිනය / திகதி / Date **2021.03.01** |

## මාධ්‍ය නිවේදනය

### රුමස්සල මාර්ගය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කළ අයුරු

රුමස්සල සාම චෛත්‍ය අසළ සිට අරලිය හෝටලය දක්වා මාර්ග සම්බන්ධයෙන් විවිධ මාධ්‍ය වාර්තා පළ වන අතර ඒ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය සතු බලතල ප්‍රකාරව නිවැරදිව කටයුතු කර ඇත.

උක්ත පාර සම්බන්ධයෙන් 2021.02.23 වන දිනයේ ද මධ්‍යම පරිසර අධිකාරියේ දකුණු පළාත් කාර්යාල මගින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කළ අතර එමගින් සහ අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනයන් අනුව පහත තොරතුරු අනාවරණ විය.

රුමස්සල සාම චෛත්‍ය අසළ සිට අරලිය හෝටලය දක්වා මාර්ගය; එම මාර්ගයේ ස්වභාවය අනුව කොටස් තුනකින් හඳුනාගත හැකිය. මාර්ගයේ සම්පූර්ණ දිග මීටර 1150කි. මෙම සම්පූර්ණ පාරෙන් වැඩි කොටසක් පරිසර සංවේදී කලාපයක පිහිටා ඇත.

1. රුමස්සල චෛත්‍යට ප්‍රවේශ මාර්ගයේ සිට රුමස්සල ජංගල් බීච් හෝටලය දක්වා අඩි 10ක් පමණ පළලින් යුතු මීටර 300ක් පමණ දිගකින් යුතු පස් පාරක් ඇත.
2. රුමස්සල ජංගල් බීච් හෝටලය අසළ සිට යද්දෙහිමුල්ල සිට පැමිණෙන කොන්ක්‍රීට් මාර්ගය දක්වා කැලෑව සහිත ඉඩමක් මැදින් ගල් සහිත බෑවුම් ප්‍රදේශයක් හරහා වැටී ඇති මීටර 250ක් පමණ දිගින් යුතු දැනට අඩි පාරක් ලෙස දිස්වන පාරක් ඇත.
3. යද්දෙහිමුල්ල සිට පැමිණෙන මීටර් 600ක් පමණ දිගකින් යුතු අඩි 10ක් පමණ පළලින් යුතු කොන්ක්‍රීට් කරන ලද මාර්ගයක් ඇත.

උක්ත අංක 2 යටතේ දක්වා ඇති මර්ග කොටස පමණක් අඩිපාරක් ලෙස නිරීක්ෂණය වූ අතර අංක 1 සහ 2 යටතේ දක්වා ඇති මාර්ග කොටසේ වාහනයක් යා හැකි ආකාරයට අඩි 10ක පමණ පළලින් යුතුව දැක ගත හැකිය.

එලෙසම අංක 2 හි දක්වා අඩි පාර සහිත මාර්ග කොටස කැලෑ සහිත බවක් දක්නට තිබෙන අතර එහි මධ්‍ය කොටසේ කුඩා දොළ පාරක් දක්නට ඇත. එලෙසම එම කොටස ජෛව විවිධත්වයෙන් යුතු ශාක පිහිටි කැලෑ භූමියක් හරහා වැටී ඇති ගල් සහිත බෑවුම් ප්‍රදේශයකි. මෙම කොටසේ පාරක් කැපීමක් හෝ ශාක ඉවත් කිරීමක් දක්නට නොලැබිණි. එලෙසම ඉහත 1 සහ 3 හි දක්වා ඇති මාර්ග ප්‍රදේශයේ ද මෑතක දී ශාක ඉවත් කිරීමක් සිදුකර ඇති බවක් දක්නට නොලැබිණි.


| Chairman | Tel : 2872361, 2872348 Fax : 2872347 | Director General | Tel : 2872359 Fax : 2872608 | General Office | Tel : 2872278, 2873447, 2873448 7877277-280 | Complaint : 2888999 |
|---|---|---|---|---|---|---|
| Deputy Director Generals | HRD. Admin. & Finance Tel : 2865296 Fax : 2877515 | Envt. Pollution Control Tel :2873453 Fax : 2872605 | Envt. Mgt. & Assess. Tel : 2872388 Fax : 2872296 | Envt. Edu. & Awareness Tel : 2872297 Fax : 2872609 | Waste Mgt. Tel: 2872409 Fax: 2882152 | |




මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு | Ministry of Mahaweli Development & Environment

මාධ්‍ය මගින් පෙන්වූ ආකාරයේ කැලෑ එළිකිරීමක් මෙම මාර්ගයට අදාළව සිදු කර නොමැති බව මෙම ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී තහවුරු විය. එහෙත්, ඉහත සඳහන් මාර්ගයට නැගෙනහිර දිශාවෙන් ගස් කපා එළිපෙහෙළි කර යාබද ඉඩමකට ප්‍රවේශ මාර්ගයක් සාදා තිබෙනු දක්නට ලැබුණි. එය රූමස්සල සාම චෛත්‍ය සඳහා රජය විසින් බදු පදනම යටතේ ලබා දී ඇති ඉඩම හරහා අනවසරයෙන් ඉදිකර ඇති මාර්ගයක් බවත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගෙන ඇති බවත් සාම චෛත්‍යය භාර ස්වාමීන්වහන්සේ විසින් ප්‍රකාශ කරන ලදී.

කෙසේ වෙතත් හබරාදූව ප්‍රාදේශීය ලේකම් 2020.10.08 දිනැතිව අප වෙත එවන ලද ලිපියට අදාළව පිළිතුරු ලිපියක් 2021.02.02 දිනැතිව හබරාදූව ප්‍රාදේශීය ලේකම් වෙත අප විසින් යොමුකරන ලදී. රූමස්සල වනජීවී අභය භූමියට අයත් ප්‍රදේශයක් හරහා මාර්ගයක් අලුතින් ඉදි කරන්නේනම් ඒ සඳහා පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබා ගත යුතු බව අදාළ ලිපිය මගින් අප විසින් ඔහු වෙත දන්වන ලදී. මේ සම්බන්ධයෙන් හබරාදූව ප්‍රාදේශීය සභාව ද දැනුම්වත් කර ඇත.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

එස්. අමරසිංහ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය